විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (14)
W.A. විමලසේන සර් - 2022. 03. 13
**(8.30 – 11.30)**

# විෂයමාලාව ක්‍රියාත්මක කිරීම අධ්‍යාපනය වෙනස් කිරීමේ ක්‍රියාවලියක් ලෙස



- විෂයමාලාව ක්‍රියාත්මක කිරීම අධ්‍යාපනය වෙනස් කිරීමේ ක්‍රියාවලියක් ලෙස
- විෂයමාලා පරිවර්තන කාරකයන්ගේ භූමිකාව
- විෂයමාලාව වෙනස් කිරීමේ ක්‍රියාවලියට බලපාන සාධක (බාහිර හා අභ්‍යන්තර සාධක)
- විෂයමාලාව වෙනස් කිරීමේ ක්‍රියාවලිය තුළ පරිවර්තන කාරකයන් වන විදුහල්පතිවරු හා ගුරුවරුන්ගේ භූමිකාව

විෂයමාලාව ක්‍රියාත්මක කිරීම විෂයමාලා සංවර්ධනයේ අත්‍යාවශ්‍ය පියවරක් වන්නේය. එබැවින් විශයමාලාවක් ක්‍රියාත්මක කිරීම සැබෑ ලෙස පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකිය. එබැවින් විෂයමාලා ක්‍රියාකාරකමක් යනු වෙනස් කිරීමේ ක්‍රියාකාරකමකි. එනම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වෙනස් කිරීමේ ක්‍රියාවලියක් ලෙසද සැලකිය හැකිය. ඒ අනුව වෙනස යන සංකල්පය අප මෙහිදී හඳුනාගත යුතුය. වෙනස යන සංකල්පය සඳහා විවිධ අර්ථකතන පවතී.

වෙනස යන සංකල්පය එහි විවිධත්වය අපට අවබෝධ කරගත හැකිය. එසේ වුවත් වෙනස යන සංකල්පයේ විවිධ අදහස්, නිර්වචන දැක්විය හැකිය. කෙසේ වෙතකත් වෙනස පිළිබඳව දක්වන අදහස තුළ කර්ට් ලෙවින් නැමැති අධ්‍යාපනඥයා වෙනස පිළිබඳව න්‍යායක් ඉදිරිපත් කරයි. ඔහු මෙම න්‍යාය මගින් ප්‍රධාන කරුණු 03 ක් අවධාරණය කරයි..

මුදාහැරීම → උත්සාහය → ස්ථාවර වීම

මෙහිදී මුදා හැරීම යනුවෙන් අදහස් කරන්නේ පවත්නා තත්වය පිළිබඳව විග්‍රහ කිරීමයි. උත්සාහය යනුවෙන් අදහස් කරන්නේ වෙනස් කිරීමේ ක්‍රියාවලිය නැතිනම් වෙනස් කිරීමේ උපාය මාර්ගය යි. ස්ථාවර යනුවෙන් අදහස් වන්නේ වෙනස, එලෙස වෙනස් වූ දෙය ක්‍රියාත්මක කිරීමට හැකි වීමයි. ඔහු වෙනස පිළිබඳ න්‍යායේදී වෙනස සිදු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංග 05 ක් ද හඳුන්වා දී ඇත. ඒ අනුව,

I. නායකත්වය
II. සන්නිවේදනය
III. මිනිස් විභව්‍යතා (වෙනස්කම්)
IV. ගැටලු විසඳීම
V. ඇගයීම

## විෂයමාලා පරිවර්තන කාරකයන්ගේ භූමිකා

කිසියම් වෙනසක් සිදුකිරීම සඳහා අපේක්ෂා කරන්නේ නම් පරිවර්තනකාරකයින් අවශ්‍ය වේ. විෂයමාලාව මගින් වෙනස්වීමේ ක්‍රියාවලිය තුළ පරිවර්තනකාරකයින් ලෙස පහත සඳහන් අයවරුන් සඳහන් කළ හැක. ඒ අනුව,

- විෂයමාලා සම්පාදකවරු
- විෂය විශේෂඥයින්
- සිසුන්
- ගුරුවරුන්
- පරිපාලකයින්
- දෙමාපියන්
- ප්‍රජාව
- අධ්‍යාපනය කෙරෙහි උනන්දුව දක්වන නියෝජිතයන්
- විශ්ව විද්‍යාල ආචාර්යය මහාචාර්යය වරුන්

යනාදී පුද්ගලයන් දැක්විය හැක. ඔවුන්ගේ භූමිකා වෙනස් කිරීමේ ක්‍රියාවලිය තුළ අත්‍යාවශ්‍යයෙන්ම හඳුනාගැනීම වැදගත් වේ.

මූලික වශයෙන්ම විෂයමාලා කණ්ඩායමක සාමාජිකයන් ලෙස ගුරුවරු, පරිපාලකයින්, අධීක්ෂකවරුන් වැඩ කරති. එහිදී විෂයමාලාවේ ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පහතින් මෙසේ දැක්විය හැක. ඒ අනුව,

- විෂයමාලාව පාසල තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රම හා උපකරණ සංවර්ධනය කිරීම.
- ව්‍යවහාරය හා න්‍යාය (ප්‍රායෝගික බව හා සිද්ධාන්ත) සංකලනය කිරීම.
- විෂයමාලා දැනුම එහි සැබෑ ලෝකය වන පාසල හා පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීම.
- විෂයමාලාව ඉගැන්වීම අධීක්ෂණය අතර සම්බන්ධතාවය පිළිබඳ හකග වීම.
- විෂයමාලාවේ අංග අතර සම්බන්ධය රඳවා ගනිමින් විෂයමාලා සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කිරීම.
- පාසල සමාජ සංධර්භයේ අංගයක් ලෙස දකිමින් (සමාජයේ කොටසක් ලෙස දැකීම) ජාතික අරමුණු හා ප්‍රජාවගේ ඉල්ලීම් හා දැක්ම අතර තුලනයක් ඇති කිරීම සඳහා පරිවර්තනකාරකයෙකු ලෙස කටයුතු කිරීම.
- නව විෂයමාලා ප්‍රවණතා පිළිබඳව විවෘත ලෙස සිතා කටයුතු කිරීම.
- විවිධ දෙමාපිය , ප්‍රජා, වෘත්තීය කණ්ඩායම් සමග මානවීය සම්බන්ධතාවය ගොඩනගා ගනිමින් ජාතික විෂයමාලාව ක්‍රියාත්මක කිරීම.
- සම මට්ටමේ කණ්ඩායම් හා වෘත්තිකයන් අතර වෘත්තීය ගැටලු විසඳීම. නවීකරණයන් සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම.
- අඛන්ඩව විෂයමාලා සංවර්ධනයට හා ක්‍රියාත්මක කිරීමට වැඩසටහන් සංවර්ධනය කලයුතු වීම.
- විෂය එතය, විෂය හා ශ්‍රේණිය අතර අනුපිළිවෙළ හඳුනා ගනිමින් විෂයමාලා සමෝධානයක් හා තුලනයක් ඇති කිරීම.
- ඉගෙනුම් ඉගැන්වීම පිළිබඳ කාලීන පර්යේෂණ පදනම් කරගන්නා නව වැඩසටහන් හා විෂයමාලා සකස් කිරීමට දායක වීම.

<u>විෂයමාලාව මගින් සිදුකරන වෙනස්වීමේ ක්‍රියාවලියට බලපාන සාධක</u>

විෂයමාලාව වෙනස් කිරීමේ ක්‍රියාවලිය තුළ බලපාන සාධක හඳුනාගත හැකිය. බොහෝ අධ්‍යාපනික වෙනස්කම් වලදී විෂය මාලාව වෙනස්වන ක්‍රියාවලිය තුළදී විවිධ භාධක නැතහොත් බලපාන සාධක පැනනගී. ඒවා සමාජමය සහ බහුවිද මට්ටමේ සමාජ ක්‍රියාවලීන් සැලසුම් කිරීමේ හා සම්බන්ධ කිරීමේදී පැනනගින සාධක ලෙස දැක්විය හැක.

මේ සම්බන්ධ අධ්‍යාපනඥයෙකු වන <u>මයිකල් ෆුලන්</u> දීර්ඝ කාලීන අධ්‍යයනයක් යටතේ ප්‍රධාන වර්ගීකරණ 04 ක් යටතේ ප්‍රධාන සාධක 15 ක් හඳුන්වා දී ඇත. ඒ අනුව ප්‍රධාන වර්ගීකරණ 04 වන්නේ,

1) <u>වෙනසෙහි ලක්ෂණ</u>

I. අවශ්‍යතාවය හා අදාළබව
II. පැහැදිලි බව
III. සංකීර්ණ බව
IV. ගුණාත්මක බව හා ප්‍රායෝගික බව

2) <u>අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ලක්ෂණ (අභ්‍යන්තර සාධක)</u>

V. නවීකරණ උත්සාහයන්ගේ ඉතිහාසය
VI. ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
VII. දිස්ත්‍රික් පරිපාලන සහය
VIII. කාර්යය මණ්ඩල සංවර්ධනය හා සහභාගීත්වය
IX. කාලරාමුව හා සන්නිවේදන පද්ධතිය
X. ප්‍රජාවේ ලක්ෂණ

3) <u>පාසල් මට්ටමේ ලක්ෂණ (අභ්‍යන්තර සාධක)</u>

XI. විදුහල්පති
XII. ගුරු - ගුරු සම්බන්ධතා
XIII. ගුරු චර්යා ලක්ෂණ හා මග පෙන්වීම්

4) <u>භාහිර සාධක</u>

XIV. රජයේ භූමිකාව
XV. භාහිර ආයතන වල සහය

මීට අමතරව පහත දැක්වෙන සාධකද විෂයමාලාව වෙනස් වීමේ ක්‍රියාවලියට එකසේ බලපාන බව මයිකල් ෆුලන් තවදුරටත් පැහැදිලි කරයි. ඒවා නම්,

- වෙනස සඳහා අවශ්‍යතාවය හා අදාළ බව, පැහැදිලි බව, සංකීර්ණ බව, ගුණාත්මක හා ප්‍රායෝගික බව, නවීකරණ උත්සාහයන්ගේ ඉතිහාසය, ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය, දිස්ත්‍රික් පරිපාලන සහය, කාලරාමුව හා සන්නිවේදන පද්ධතිය, පාසල් සංවර්ධන මණ්ඩල හා ප්‍රජාවේ ලක්ෂණ, විදුහල්පති හා ගුරු භූමිකා.

යනාදියයි.

# විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය තුළ විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ භූමිකාව

## විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය තුළ විදුහල්පතිවරයාගේ භූමිකාව

පාසල් මට්ටමේ විෂයමාලා ක්‍රියාත්මක වීමේදී විෂයමාලාව ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වීම වගකීම ගන්නේ විදුහල්පතිවරයා හා ගුරු මණ්ඩලය මගිනි. එසේම විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ නායකත්වය දරන්නේ විදුහල්පතිවරයාය. එබැවින් පාසලක ගුරුවරුන්ගේ භූමිකාව ඉතාම වැදගත් වේ. ඒ අනුව විදුහල්පති වරයාගේ භූමිකාව විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ආකාරය මෙසේ දැක්විය හැක.

- විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මූලික වගකීම ඔහු සතුව වේ.
- පාසලේ දැක්ම, මෙහෙවර හා අරමුණු අවබෝධ කරගෙන විෂය මාලාව ක්‍රියාත්මක කිරීම.
- විෂයමාලාව සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට දායක වන සෑම පිරිසක් සමගම මනා සන්නිවේදන ජාලයක් ගොඩනංවා ගැනීම.
- විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට දායක වන පිරිස් උපස්ථම්භනය (පොළඹවීම) සිදුකළ යුතුය.
- විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී උපදේශාත්මක නායකයෙකු ලෙස කටයුතු කළ යුතුය. (අවශ්‍ය මග පෙන්වීම් හා උපදෙස් ලබා දීම/ අවශ්‍ය උපදෙස් ලබා දෙමින් දිරි ගැන්වීම/ අවශ්‍ය අඩුපාඩු පෙන්වා දෙමින් අදහස් විමසීම හා ඉදිරිපත් කිරීම/ නව තාක්ෂණය භාවිතා කරන ක්‍රමවේදයන් සලස්වා දීම)
- විෂයමාලා ක්‍රියාකාරකම් සඳහා කාලය සම්පාදනය කර දීම. (නිදසුන් - අමතර පංති පැවැත්වීම)
- සේවස්ථ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා යොමු කිරීම.
- සම්පත්දායක නියෝජිතයෙකු ලෙස විෂයමාලා උපදේශන කමිටු නියෝජනය කිරීම. (වෙනත් පාසල් සමග සම්බන්ධවී විදුහල්පති වැඩසටහන් ආදියට සම්බන්ධ වී එතුළ දෙනු ලබන උපදෙස් වලට හොඳින් ඇහුම්කන් දී ඒවා පාසල තුළදී ක්‍රියාවට නැංවීම)
- විෂයමාලා සැලසුම් කරනයේදී සියලුදෙනාගේ වගකීම් හා වගවීම් වලට ප්‍රධාන සමායෝජක ලෙස කටයුතු කිරීම.
- ගුරු වෘත්තීය සංවර්ධනයක් ඇති කිරීම මගින් විෂයමාලා කටයුතු වලට සම්බන්ධ කිරීම ( පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - SBTD)

## විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය තුළ ගුරුවරයාගේ භූමිකාව

විෂයමාලා තීරණ ගැනීමේ කේන්ද්‍රීය තත්වය, ගුරුවරයා කටයුතු කරයි. ක්‍රියාත්මක වෙමින් පවතින විෂයමාලාවක ඇත්තේ කුමන අරමුණක්ද යන්න ගුරුවරයා අවබෝධ කරගත යුතු වේ. ක්‍රියාකාරකම් සඳහා ගත කරන කාලය කොතරම්ද යන්න ගුරුවරයා තීරණය කරනු ලබන අතර විෂය මාලාව ක්‍රියාත්මක වීමේදී වඩාත් ප්‍රබල කාර්යක් ඉටු කරනු ලබන්නේද ගුරුවරයාය.

සත්‍ය වශයෙන්ම ගුරුවරයා විෂයමාලා සංවර්ධනයේ සෑම පියවරකදීම එයට සහභාගී විය යුතුය. නමුත් බොහෝ ගුරුවරුන් වඩාත්ම දායකත්වයතක් දක්වන්නේ විෂය මාලාව ක්‍රියාත්මක කිරීමටයි. ඉගැන්වීම යනු විෂය මාලාව ක්‍රියාත්මක කිරීමයි. එබැවින් විෂය මාලාව ක්‍රියාත්මක කිරීම තුළ වඩාත් සංකීර්ණ වූ ගුරු භූමිකාවක් ඉටු කරන බව මනාව පැහැදිලි වේ. තවද,

- පරිකල්පනය
- නිර්මාණශීලිබව
- ස්වයං අධ්‍යයනයට යොමුවීම
- නිර්මාණශීලිව අදහස් දැක්වීම
- තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ වීම

යනාදියත් ගුරු භූමාකාවේ කාර්යයන් බවට පත් වී ඇත.

පැවරුම

I. අධ්‍යාපන වෙනස් කිරීමේ ක්‍රියාවලිය ලෙස හඳුන්වන්නේ කුමක්ද ?

II. විෂයමාලාව වෙනස්වීමේ ක්‍රියාවලියට බලපාන සාධක මොනවාද ?

III. ඵලදායී විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියට ගුරුවරුන් හා විදුහල්පතිවරුන් දායක වන්නේ කෙසේදැයි විමර්ශනය කරන්න.